# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1553 /2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 10/12/2023<br>පැය 1635 |

## මාධ්‍ය නිවේදනය

### "පොලිස්පති මහජන සහන දිනය" නැවත ආරම්භ කිරීම - පොලිස් මූලස්ථානය.

දිවයිනේ පොලිස් ස්ථාන හා විවිධ විමර්ශන අංශයන් වෙත මහජනයා විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි අතුරින් නිසි ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වූ පැමිණිලි සම්බන්ධයෙන් සෘජුවම පොලිස්පතිතුමා වෙත ඉදිරිපත් කිරීම සඳහා මහජනයාට අවස්ථාව ලබා දෙමින් රජයේ නිවාඩු දිනයන් හැර සෑම සිකුරාදා දිනකම පොලිස් මූලස්ථානයේ පොලිස්පති වරයාගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වූ **"පොලිස්පති මහජන සහන දිනය"** පසුගිය කාල පරිච්ඡේදයේ ලෝකය පුරා පැතිරගිය Covid 19 වසංගත රෝගී තත්ත්වය හේතුවෙන් නතර කිරීමට සිදුවිය.

මෙතෙක් කාලයක් නතරකර තිබූ **"පොලිස්පති මහජන සහන දිනය"** 2023.12.15 වන සිකුරාදා දින සිට නැවත ආරම්භ කිරීමට වැඩබලන පොලිස්පතිතුමා විසින් තීරණය කර ඇත. ඒ අනුව සෑම සිකුරාදා දිනකම පැය 0900 ට ( රජයේ නිවාඩු දිනයන් හැර ) මහජන සහන දිනය ආරම්භ වන අතර පොලිස් ස්ථානවලට සහ විමර්ශන අංශ වලට පෞද්ගලික කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද පැමිණිලි වලදී අපේක්ෂිත සහනයක් නොලැබුණේ නම් හෝ අනවශ්‍ය ප්‍රමාදවීම් පිළිබඳව වන යුක්ති සහගත සහ සාධාරණ කරුණු සම්බන්ධයෙන් පොලිස්පතිතුමා වෙත එම දිනයන්ට පැමිණිලි ඉදිරිපත් කල හැකිය. අදාල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද සම්බන්ධ කර ගනිමින් පවත්වන මෙම මහජන සහන දිනය තුලින් මහජනයාට ශ්‍රී ලංකා පොලිසිය තුලින් සිදුවිය යුතු සේවය ප්‍රමාදයකින් තොරව හරියාකාරව සාධාරණ ලෙස ඉටුකරදීම අපේක්ෂාවයි.

එ් අනුව වැඩබලන පොලිස්පතිතුමා ද සෑම සිකුරාදා දිනකම මහජන සහන දිනයට පැමිණීමට අපේක්ෂා කරන අතර එහිදී සෘජුවම මහජනතාවගේ පැමිණිලි පිළිබඳව පිලිතුරු ලබාදීම සිදුකරෙනු ඇත.

ශ්‍රී ලංකා පොලිසිය මගින් සිදු කරනු ලබන මහජන සේවය වඩාත් ගුණාත්මකව සිදුකරගෙන යමින් පොලිසිය කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කරමින් පැමිණිලිකරුවන්ගේ ගැටළු වලට කඩිනමින් හා නිවැරදි විසඳුම් ලබාදීම තුලින්

පොලිසිය හා මහජනතාව අතර පවතින සම්බන්ධතාවය වැඩිදියුණු වන බව වැඩබලන පොලිස්පති වරයාගේ විශ්වාසයයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**